**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

**අ.පො.ස. (සා / පෙළ ) - පෙරහුරු ප්‍රශ්න පත්‍ර**

**ENTREPRENEURSHIP STUDIES**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය**

# QUESTION PAPER - II

# ප්‍රශ්න පත්‍රය - II




අනුග්‍රහය :

# අධ්‍යාපන අමාත්‍යාංශය

## ව්‍යවසායකත්ව අධ්‍යයනය - I, II

## අ.පො.ස. (සා/ පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 3 යි**

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි

*Additional Reading Time – 10 minutes*

- පළමු වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1 . පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා ( i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

කාබනික පොහොර භාවිතයෙන් විවිධ එළවළු හා ධාන්‍ය වර්ග වගා කරන ඉඩම් හිමි වැවිලිකරුවකු වන හර්ෂණ ද සිල්වා දේශීය වෛද්‍ය විද්‍යාලයේ පෝෂණවේදය පිළිබඳ උපාධිධාරියෙකි. ඔහු ජාතික රෝහල ආසන්නයේ විවිධ කැඳ වර්ග හා ආහාරපාන සපයන වෙළඳ සැලක් ආරම්භ කරන ලදී. එහි අලෙවි කරන ලද්දේ මුළුමනින්ම තම ගොවිපලින් ලබාගන්නා නිෂ්පාදන වලින් තනන ලද ආහාර පාන වර්ග පමණි. රෝගීන් හා රෝහල කාර්ය මණ්ඩලය මෙන්ම රෝගීන් පරීක්ෂාවට පැමිණෙන අයට මෙම වෙළඳසැල ඉතාම පෝෂණයෙන් ඉහළ ගුණාත්මක ආහාර, පාන වර්ග සපයන ස්ථානයක් විය.

හර්ෂණ ද සිල්වා මෙම වෙළඳ සැල ආරම්භ කිරීම සඳහා තමා සතු රු. 500,000 ක මුදල හා මහජන බැංකුවෙන් ලබාගත් රු.300,000 ක ණය මුදල යොදා ගන්නා ලදී. මහජන බැංකුවේ ජංගම ගිණුමක් ආරම්භ කළ ඔහු සියළු ගෙවීම් බැංකු මගින් සිදුක කරන ලදී. ඔහුගේ වෙළඳසැල "හර්ෂණ නැචුරල් ෆුඩ්ස්" ලෙස ලියාපදිංචි කර ඇත. ඔහුගේ සහායට සේවකයින් දෙදෙනෙකු බඳවා ගෙන ඇත. ඔවුන්ට මාසිකව රු. 20,000 බැගින් වැටුප් ගෙවන අතර, ව්‍යාපාරය පිහිටි ගොඩනැගිල්ල සඳහා මසකට රු. 10,000 ක කුලියක් ගෙවිය යුතුය. හර්ෂණ ව්‍යාපාරයේ නොමැති අවස්ථාවල දී ඔහුගේ බිරිඳ ව්‍යාපාර කටයුතු සඳහා තම සේවය ලබා දෙනු ඇත.

i. "හර්ෂණ නැචුරල් ෆුඩ්ස්" ආයතනය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් වේද ?
ii. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්ය ද ? හේතු දක්වන්න.
iii. "හර්ෂණ නැචුරල් ෆුඩ්ස්"හි ශක්තීන් හා අවස්ථා එක බැගින් නම් කරන්න.
iv. මෙම ව්‍යාපාරයේ ආරම්භක වත්කම කොපමණද ?
v. "හර්ෂණ නැචුරල් ෆුඩ්ස්" ව්‍යාපාරයේ වාසි දෙකක් සඳහන් කරන්න.

හර්ෂණ ද සිල්වා තම ව්‍යාපාරයේ ඉදිරි වර්ෂයේ අපේක්ෂිත ඇස්තමේන්තු හා තොරතුරු පහත පරිදි ඉදිරිපත් කර ඇත.

| | (රු.) |
|---|---|
| විකුණුම් | 750,000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 150,000 |
| ශ්‍රම පිරිවැය | 180,000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 50,000 |
| පරිපාලන වියදම් | 120,000 |
| ණය වාරික හා පොලී ගෙවීම් | 40,000 |
| විකුණුම් වියදම් | 60,000 |

ඉහත තොරතුරු ඇසුරෙන් "හර්ෂණ නැචුරල් ෆුඩ්ස්" ව්‍යාපාරයේ,

vi. ලාභය හෝ අලාභය ගණනය කරන්න.
vii. ශුද්ධ විකුණුම් ආදායම කොපමණ ද?
viii. මුළු නිෂ්පාදන පිරිවැය කොපමණ ද?
ix. ණය වාරිකය තුළ රු. 6000 ක් පොලිය අන්තර්ගත වී නම් වගකීම් හා වියදම් කොටස් හි අගයන් වෙන් වෙන්ම දක්වන්න.
x. සත්‍ය වශයෙන්ම මෙම ආදායම් හා වියදම් බැංකු ගිණුම හරහා සිදු කර ඇත්නම් අවසාන මුදල් ශේෂය කොපමණ වේද ?

(ලකුණු 02 X 10 = 20 යි)

2.

i. ව්‍යාපාර සංවිධානයක විවිධ කළමනාකරණ මට්ටම් තුනක් දක්වන්න.
ii. කළමනාකරණ ක්‍රියාවලියේ මූලිකාංග නම් කරන්න.
iii. ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ හතරක් දක්වන්න.
iv. ව්‍යාපාර සංවිධානයක ඔබ හඳුනාගන්නා ශක්තීන් දෙකක් හා දුර්වලතා දෙකක් නම් කරන්න.
v. මිනිස් අවශ්‍යතා තුනක් නම් කර, ඊට අදාළ උවමනා දෙක බැගින් නම් කරන්න.

(ලකුණු 02 X 05 = 10 යි)

3.

i. ව්‍යවසායකයෙකු අනුගමනය කළයුතු යුතු ව්‍යාපාර ආචාරධර්ම තුනක් නම් කරන්න.
ii. ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් ව්‍යවසායකයෙකුට ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.
iii. ව්‍යාපාරයක නෛතික වගකීම සඳහා උදාහරණ දෙකක් දකවන්න.
iv. මූල්‍ය සැලැස්මක් මගින් අනාවරණය කරගත හැකි තොරතුරු තුනක් නම් කරන්න.
v. ව්‍යාපාරයක් සඳහා බැංකු ණය මුදලක් ලබා ගැනීමේදී බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ලියවිලි හතරක් නම් කරන්න.

(ලකුණු 02 X 05 = 10 යි)

4.

i. රජය විසින් ව්‍යවසායකයින් දිරිගැන්වීමට ලබාදෙන දිරිගැන්වීම් දෙකක් නම් කරන්න.
ii. හවුල් ව්‍යාපාරයක සීමා දෙකක් නම් කරන්න.
iii. හවුල් ව්‍යාපාරවල සිට, සීමාසහිත සමාගම් වලට තම ව්‍යාපාරය පරිවර්තනය කිරීමට බොහෝ ව්‍යවසායකයින් පෙළඹෙන්නේ මන්ද?
iv. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වරලත් ව්‍යාපාර වලට නිදසුන් තුනක් සපයන්න.
v. හවුල් ගිවිසුමක් නොමැති විට අනුගමනය කරනු ලබන නියමයන් හතරක් නම් කරන්න.

(ලකුණු 02 X 05 = 10 යි)

5.

i. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ව්‍යවසායකයෙකු විසින් සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න.
ii. ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශව වර්ග කර දක්වන්න.
iii. ව්‍යාපාරයක් ස්ථාන ගත කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු හතරක් සඳහන් කරන්න.
iv. හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණ හතරක් නම් කරන්න.
v. ව්‍යාපාරවල සමාජ වගකීම් හතරක් නම් කරන්න.

(ලකුණු 02 X 05 = 10 යි)

6.

i. ව්‍යාපාරික අදහස් උත්පාදනය වන මූලාශ්‍ර හතරක් දක්වන්න.
ii. කාන්තා ව්‍යවසායකත්වය ශ්‍රී ලංකාවේ බහුලව ව්‍යාප්ත වෙමින් පවතී. ඊට හේතු වූ කරුණු හතරක් නම් කරන්න.
iii. ව්‍යවසායකයින් පුහුණුව තුළින් හා උත්පත්තියෙන් බිහිවිය හැක. මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වේ ද ? පැහැදිලි කරන්න.
iv. නව ව්‍යවසායකයින් නිර්මාණය කිරීමට රජයට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් නම් කරන්න.
v. වෙළඳපල විශ්ලේෂණයකින් හඳුනාගත හැකි කරුණු දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 02 X 05 = 10 යි)

7. අමල් පෙරේරා තනි පුද්ගල ව්‍යාපාරයක් ආරම්භක කර පවත්වාගෙන යාමට අපේක්ෂා කරන අතර, ඔහුගේ ව්‍යාපාරයේ ව්‍යාපාර සැලැස්මෙන් 2020 වර්ෂය සඳහා උපුටා ගන්නා ලද තොරතුරු පහත දැක්වේ.

| | (රු.) |
|---|---|
| හිමිකරුගේ ප්‍රාග්ධනය | 1,000,000 |
| බැංකු ණය | 800,000 |
| අපේක්ෂිත විකුණුම් (අත්පිට මුදලට) | 1,200,000 |
| අපේක්ෂිත විකුණුම් (ණයට) | 800,000 |
| ණයගැති ලැබීම් | 500,000 |
| බැංකු ණය වාරික ගෙවීම් | 60,000 |
| පරිපාලන වියදම් | 100,000 |
| ගැනුම් (අත්පිට මුදලට) | 700,000 |
| ගැනුම් (ණයට) | 300,000 |
| උපකරණ මිලට ගැනුම් | 240,000 |
| විකිණීමේ හා බෙදා බෙදා හැරීමේ වියදම් | 100,000 |
| මූල්‍ය හා පොත් වියදම් | 50,000 |

අවශ්‍ය වන්නේ,

i. 2020 වර්ෂය සඳහා අමල් පෙරේරාගේ ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ලකුණු 06 යි)
ii. 2020 වසර අවසානයේදී ව්‍යාපාරයේ මුදල් ශේෂය. (ලකුණු 02 යි)
iii. අමල් පෙරේරා ආරම්භ කිරීමට අපේක්ෂිත තනි පුද්ගල ව්‍යාපාරයේ මූලික ලක්ෂණ හතරක් දක්වන්න.

(ලකුණු 02 යි)

(මුළු ලකුණු 10 යි)